දැන්වීමයි !

කොළඹ මහා නගර සභාව

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහානගර සභාවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 - සේවා ගණයේ ක්‍රීඩා උපදේශක III තනතුර සඳහා බඳවා ගැනීම (සීමිත) – 2026

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ක්‍රීඩා උපදේශක තනතුරෙහි III ශ්‍රේණියේ තනතුර සඳහා සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන් වෙතින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ප්‍රාථමික සේවා ගණයේ තනතුරක ස්ථිර සේවක සේවිකාවන් හට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය. මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට මේ සමග දැක්වෙන ආදර්ශ අයදුම්පත අනුව, අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීගේ නිර්දේශය ද සහිතව 2026.07.28 දින ට පෙර නාගරික ලේකම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

1. තනතුරු නාමය:
   බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහානගර සභාවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 - සේවා ගණයේ ක්‍රීඩා උපදේශක III ශ්‍රේණිය

2. වැටුප් කේත අංකය:
   MN 1 – 2025 (රා.ප.ව. 10/2025 අනුව)
   රු. 45,320 – 10x540 – 11x630 – 10x890 – 10x1190 – 78,360

3. අධ්‍යාපන සුදුසුකම්:
   අ.පො.ස.(සා/පෙල) විභාගයේ දී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය ඇතුළුව විෂයයන් 06ක් යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථයන් 02ක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වී තිබීම

4. වෘත්තීය සුදුසුකම්
   ජාතික/පළාත්/දිස්ත්‍රික්ක/කලාප/පාසල් මට්ටමේ වර්ණලාභියෙකු වීම
   හෝ
   පිළිගත් ආයතනයක ක්‍රීඩා කළමනාකරණය, ක්‍රීඩාංගන හා නඩත්තුව පිළිබඳ අවම වශයෙන් මාස 06 ක පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතිකයක් ලබා තිබීම

5. පළපුරුද්ද:
   කොළඹ මහා නගර සභාවේ ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක ස්ථිර කර තිබීම හා අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන 2026.07.28 දිනට පූර්වාසන්න වසර 05 ක අඛණ්ඩ හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

6. කායික සුදුසුකම්:
   තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

7. වෙනත්:
   i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
   ii. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8. වයස:

රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගෙන් බඳවා ගන්නා බැවින් වයස් සීමාවන් අදාළ නොවේ.

9. බඳවා ගැනීමේ ක්‍රමය:

පහත සඳහන් ලිඛිත විභාගයෙන් සමත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ලිඛිත විභාගයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු වල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

i. ලිඛිත පරීක්ෂණය:

විෂයය ක්ෂේත්‍රය	කාලය	මුලු ලකුණු ප්‍රමාණය	අවම සමත් ලකුණු ප්‍රමාණය
<u>මූලික ක්‍රීඩා දැනුම</u> ජාතික ක්‍රීඩා/ විවිධ ක්‍රීඩා පිළිබඳ තාක්ෂණික දැනුම හා ක්‍රීඩා නීති රීති පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න පත්‍රයකි.	පැය 02	100	50
<u>අභියෝග්‍යතාවය</u> තර්කන ශක්තිය, ගණිත කුසලතාවයන්, ක්ෂණික තීරණ ගැනීමේ හා කාලය කළමනාකරණය කිරීම පිළිබඳ ඇගයීමේ ප්‍රශ්න පත්‍රයකි.	පැය 01	100	50

ii. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය:

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර	මුලු ලකුණු ප්‍රමාණය	අවම සමත් ලකුණු ප්‍රමාණය
විශේෂ රාජකාරී කටයුතුවලදී විෂයයට අදාළව දක්වන ලද දායකත්වයන් (එක් දායකත්වයක් සඳහා ලකුණු 05 බැගින්)	50	**50**
කාර්යසාධනය ඇගයීම (උසස් කිරීමේ දිනට පූර්වාසන්න අඛණ්ඩ වසර 05 සඳහා) ඉතා හොඳයි - 09 හොඳයි - 05 සතුටුදායක - 02	45	
පෞරුෂත්වය	05	
එකතුව	**100**	

10. විභාග ගාස්තු:

- කොළඹ මහා නගර සභාවේ 2025.01.28 දින ඇති මූල්‍ය කළමනාකරණ කමිටුවේ තීරණ අංක 1137 පරිදි කොළඹ මහා නගර සභාව විසින් පවත්වනු ලබන විභාග සඳහා ගාස්තු අය කිරීම යටතේ ප්‍රථම වතාවට පෙනී සිටින අයදුම් කරුවන්ට විභාග ගාස්තු අය නොකෙරේ. දෙවන අවස්ථාවේ සිට සම්පූර්ණ විභාගය සඳහා රු. 500 යි.

- කොළඹ මහා නගර සභාවේ නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ පරිපාලන ආදායම් ශීර්ෂ 7112015025 ගිණුමට බැරවන පරිදි කොළඹ මහා නගර සභාවේ සරප් අංශය වෙත ගෙවා ලබාගත් ලදුපත අදාළ හිස්තැනෙහි ඇලවිය යුතුය.

11. තනතුර සඳහා බඳවා ගන්නා සංඛ්‍යාව 08 කි.

2026.07.28 වන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අත්හැරීම් හා ප්‍රමාද දෝෂ පිළිබඳ වගකීම ඒ ඒ දෙපාර්තමේන්තුවේ විෂය භාර නිලධාරි වෙත පැවරේ.

මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

ඒ.ඩී.එස්.රෝහණ
නාගරික කොමසාරිස්
කොළඹ මහා නගර සභාව

ඒ. ඩී. එස්. රෝහණ
නාගරික කොමසාරිස් (රා.ප.)
කොළඹ මහා නගර සභාව

2026 ජූලි මස 29 වන දින
කොළඹ මහා නගර සභාවේ
නාගරික කොමසාරිස් කාර්යාලයේ දී ය.